**<u>රත්නපුර මහා නගර සභාව</u>**

**<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>**

01. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 07 දින සභාවේ නාගරික කොමසාරිස්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබාදී තිබූ රු. 54,566,853 ක ණය මුදලේ වාරික වලට හිලව් වශයෙන් මහා නගර සභාවට නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලැබිය යුතු තානායම් කුලී මුදලින් සියයට 50 ක් 2004 ජූලි සිට හිලව් කර තිබුණි. ඒ අනුව රු. 2,785,664 ක් එසේ හිලව් කර තිබූ බව විගණනය විසින් හඳුනාගෙන තිබූ නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබූ අතර, ලබා ගන්නා ලද යථෝක්ත සම්පූර්ණ ණය මුදල ගෙවිය යුතු ණය මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ වැය විෂයයන් සහ ගබඩා අත්තිකාරම් යටතේ මිලදීගත් එකතුව රු. 1,224,019 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව වර්ෂය තුළදී ගෙවීමට නොහැකි වූ රු. 2,094,259 ක් වටිනාකමැති වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල පුස්තකාල පොත් 1965 ක් පරිත්‍යාග ලෙස ලැබී ඇති අතර ඒ අතරින් වටිනාකම සඳහන් කර ඇති පොත් 1087 ක වටිනාකම රු. 624,835 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබූ අතර, ඉතිරි පොත් 878 සඳහා වටිනාකම හඳුනාගෙන හෝ තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ප්‍රේෂණය කල යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල රු. 119,824 ක් බවට තහවුරු වුවද, රු. 277,469 ක් වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) පොදු පරිපාලන, සංවර්ධන සහ සැලසුම් යන ජංගම ගිණුම් වලට අදාලව සභාව විසින් පවත්වා ගෙන තිබූ සාරාංශ මුදල් පොත් අනුව ශේෂය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ ශේෂයන්

අතර වර්ෂ ගණනාවක සිට වෙනස්කම් නිරීක්ෂණය වන අතර, සමාලෝචිත වර්ෂයේදී එම වෙනස රු. 3,395,935 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල තුලනය පිළිබඳව විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(උ) 2015 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය නිවැරදි කිරීම ලෙස රු. 7,193,640 ක් ගිණුම් මඟින් ගලපා තිබුණද, පවත්වා තිබූ මුද්දර ගාස්තු ලේඛණය අනුව එම වටිනාකම රු. 6,674,140 ක් විය යුතු විය.

(ඌ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර අංක 1632 යටතේ රත්නපුර වෙරළුප පාර සංවර්ධන කිරීමේ ණය මුදල වූ රු. 12,656,450 ට අදාලව ඉදිරිපත් කර ඇති ණය සනාථන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 10,378,289 ක්වූ පොලී මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ආදායම් ශීර්ෂ 11 කට අදාලව පසුගිය වර්ෂය වෙනුවෙන් ලද එකතුව රු. 528,898 ක්වූ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) ආදායම් ශීර්ෂ 12 කට අදාලව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරි වර්ෂයේදී ලද එකතුව රු. 1,383,007 ක්වූ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඔ) 2014 ගිණුම් විගණනයේදී සේවක ණය පොලී ලැබීම් රු. 739,765 ක් අදාල අයශීර්ෂය යටතේ ගිණුම්ගත කල යුතු බව පෙන්වා දී ඇති නමුත් ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාලවද සේවක ණය පොලී ලැබීම් රු. 768,661 ක් අදාල අය ශීර්ෂ යටතේ ගිණුම්ගත නොකර එම වටිනාකමද සේවක ණය ලැබීම් ලෙස සේවක ණය ගිණුම මඟින් ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සේවක ණය පොලියද සේවක ණය ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සේවක ණය ජංගම වත්කම් රු. 6,702,222 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපණය විය.

(ක) ගමින්ගමට දොරින් දොරට වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 03 ක් 2014 වර්ෂයේදී වැඩ අවසන් කල නමුත් විගණිත දිනය වූ 2016 ජූනි 13 දින වනවිටත් රු. 1,750,851 ක්වූ මුදල් ගෙවා නොමැති බැවින් ණයහිමියන් යටතේ සහ උක්ත කර්මාන්ත සඳහා ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් ප්‍රකාශ මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතවී ක්‍රියාත්මක කර තිබූ එකතුව රු. 4,296,449 ක්වූ බාහිර ප්‍රතිපාදන සඳහාවූ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ච) 2014 වර්ෂයේ ගිවිසුම්ගතවී ඉටු කරන ලද රු. 4,971,813 ක වටිනාකමින් යුතු කර්මාන්ත සඳහා අදාල වර්ෂයේ ණයහිමි හා ණයගැති ප්‍රතිපාදන වෙන් කර නොමැතිව සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොමැති අතර, තොග ලේඛණ යාවත්කාලීන නොවීම් හා නිකුතු නියෝග අනුව නිසි පරිදි භාණ්ඩ නිකුත් කිරීම හා ලේඛණ පවත්වා නොතිබුණි. ඒ අනුව තොග ලේඛණයන්හි අවසාන ශේෂය හා අතැති තොග පරීක්ෂා කිරීමේ අවස්ථාව ඇහිරී තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව රු. 23,004,503 ක්වූ අතැති තොග ලේඛණ අනුව හඳුනාගත නොහැකි විය.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 10 කට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 51,299,614 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 10 ක් සම්බන්ධයෙන් වියදම් විග්‍රහයෙහි සඳහන් අගය සහ වැය ලේඛණයෙහි අගය අතර රු. 45,098,164 ක වෙනස්කම් විය.

(ඇ) අයශීර්ෂ 04 කට අදාලව ලේඛණය අනුව බිල්කල ආදායම සහ වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ ආදායම අතර රු. 227,785 ක වෙනස්කම් විය.

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
-----------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) | |
| | 247 (ඇ) වගන්තිය | යම් වෙළඳ ව්‍යාපාරයක් යම් මහා නගර සභාවක පාලන සීමා තුල යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන අවස්ථාවකදී ඒ සභාව මඟින් යෝජනා සම්මතයක් මඟින් ඒ තැනැත්තා විෂයයෙහි වාර්ෂික බද්දක් නියම කල යුතු වුවත්, රත්නපුර තානායම සඳහා 2013, 2014 හා 2015 වර්ෂ සඳහා එවැනි බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 396 | ගිණුම් අංක 0001015721 ට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මාස 06 ඉක්මවා ඇති නිකුත් කල නමුත් නිශ්කාශනය නොවූ රු. 524,029 ක්වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 571 | තැන්පතු ගිණුම් 20 කට අදාලව 2001 වර්ෂයේ සිට පැවතඑන වසර 02 ඉක්මවා ඇති එකතුව රු. 23,099,511 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි 880 හා 881 | සභාවේ කිසිඳු නිලධාරියෙකුගෙන් සේවක ඇප තබා ගැනීමක් කර නොතිබුණි. ඒ අනුව මුදල් පරිපාලන කටයුතු වල නිරත නිලධාරීන්ගේ වගකීම හා බැඳී ආරක්ෂාව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි විය. |

02. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 46,579,450 ක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වැඩිවූ වියදම රු. 21,719,263 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 68,298,713 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 314 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් වල වැඩිවීම හා පුනරාවර්තන වියදම් වල අඩුවීමයි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 32,500 | 32,999 | 27,198 |
| බදු කුලී | 62,558 | 49,376 | 19,487 |
| බලපත්‍ර ගාස්තු | 3,242 | 1,814 | - |
| වෙනත් ආදායම් | 240,732 | 44,225 | 32,518 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 26, සියයට 25, සියයට 44, සියයට 88 හා සියයට 65 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 කඩ කාමර බදු දීම

--------------------

(අ) කඩකාමර තැනීම සඳහා වැයවන සම්පූර්ණ මුදලම බදුකරුගෙන් අයකර අදාල ඉදිකිරීම සිදුකර තිබූ අවස්ථාවක වුවද කඩකාමරයක් හිස්වූ විට පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01හා 2009 මාර්තු 09 දිනැති චක්‍රලේඛණයේ 02 වන ඡේදයේ 1.8 වගන්තිය පරිදි කඩකාමරය ටෙන්ඩර් කැඳවා බදු දීම කල යුතු අතර, එසේ නොවේ නම් 1.9 වගන්තිය අනුව බදුකරුගේ මරණින් පසු කාලත්‍රයාට හෝ දරුවෙකුට බදු අයිතිය පැවරිය හැකිය. එසේම අවිවාහක බදුකරුවෙකු නම් තම මව, පියා හෝ සහෝදරයෙකුට පැවරීම කල හැකි වුවත්, චක්‍රලේඛයේ එකී වගන්ති පිළිබඳ නොලසකා කඩකාමර බදුගත් මුල් බදුකරුවන් නම් කරන ලද වෙනත් පුද්ගලයන් වෙත නම පවරා කඩකාමර බදු දී තිබුණි.

(ආ) බදුකරුවන්ට ගෙවීමට සිදුවන බදු මුදල වැඩිවීම අධික වීම වැලැක්වීම හා ඔවුන්ගේ බදු බර අඩුකර ගැනීම සඳහා අංක 2009/01 හා 2009 මාර්තු 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වන ඡේදයේ නියමයට අනුව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් එකී තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු නමුත්, කුඩුගල්වත්ත වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩකාමර 09 ක

බදුකුලිය ප්‍රථම වරට 1996 වර්ෂයේදී තක්සේරු කර තිබුණි. පසුව නැවත අවුරුදු 19 කට පසුව 2015 අප්‍රේල් 10 දින තක්සේරු කර තිබුණි. මේ අනුව යොමුගත රෙගුලාසිය පරිදි කටයුතු නොකිරීමෙන් එකවර අධිකව වැඩිවන බදු මුදල් බදුකරුවන් විසින් නොගෙවා පැහැර හැරීමේ අවදානමක් ඇති වී තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට අයවිය යුතු එකතුව රු. 3,461,453 ක ඉඩම් බදු, මහජන පොල කඩ බදු හා පොදු වෙළඳසැල ආදායම් සභා තීරණයක් මත කපා හැර තිබුණි.

(ආ) සභාව සතු තානායමේ පාලනය නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරා තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය හා බදුකරුවෙකු අතර ඇතිවූ ගිවිසුම් අනුව ගිවිසුම්ගත දින සිට වසර 20 ක් සඳහා තානායමේ කළමනාකරණ ගාස්තුව රු. 70,500 සිට වාර්ෂිකව සියයට 5 බැගින් වැඩිවන ආකාරයට බදු දී තිබුණි. මහා නගර සභාව ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබාගත් ණය මුදලට හිලව් වශයෙන් උක්ත කළමනාකරණ ගාස්තුවෙන් සියයට 50 ක් අඩුකර තිබුණි. ඒ අනුව සම්පූර්ණ කළමනාකරණ ගාස්තුව මහා නගර සභාවේ ආදායම් වශයෙන්ද ණය මුදලට හිලව් කරන මුදල ණය පියවීම් වශයෙන්ද ගනනය කර ගිණුම්ගත විය යුතු වුවත්, එම තත්ත්වය ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබුණි. තවද, උක්ත කළමනාකරණ ගාස්තුවෙන් 1995 දෙසැම්බර් මස සියයට 10 ක් හා 2003 ජූලි මස සිට සියයට 30 ක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය රඳවාගෙන ඇති නමුත් එම අඩුකිරීම සම්බන්ධයෙන්ද නිසි පියවරක් ගෙන නොතිබුණි.

3.2 ගිණි නිවීමේ ඒකකයේ ක්‍රියාකාරිත්වය

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 අගෝස්තු 31 දින ගිණි නිවීමේ ඒකකය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල භෞතිකව පරික්ෂා කිරිමේදී නිසි පාලන ක්‍රමවේදයක් මෙම අංශය මඟින් ක්‍රියාත්මක කර නොතිබූ බව අනාවරණය විය. රත්නපුර ප්‍රදේශයේ හදිසි තත්ත්වයක් ඇති වුවහොත් ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් ගිණි නිවීමේ අංශය සතුව නොතිබුණු බවද, සභා බල ප්‍රදේශයට පමණක් නොව රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනයකට අයත් එකම ගිණි නිවීමේ ඒකකය පිළිබඳව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොමැති බවද, ඒ අනුව හදිසි අවස්ථාවකට මුහුණ දීමට ප්‍රමාණවත් ශක්තියකින් යුක්තවේද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ආ) හදිසි ආපදා තත්ත්වයන්හිදී භාවිතා කිරීම සඳහා වන නිල්පාට විදුලි බුබුළු සහිත ආපදා රථ ගිණි නිවීමේ හා මුදවා ගැනීමේ කාර්යයන් සඳහා යොදවා ගත යුතු වුවත්, ලියාපදිංචි අංක PB 6386 දරණ ගිණි කැබ් රථය නාගරික කොමසාරිස් අනුමැතිය මත විවිධ අවශ්‍යතා සඳහා යොදවා තිබූ අතර, එම රථයේ ගමන්, දුර ප්‍රමාණ, ලබාගත් ඉන්ධන ඇණවුම් අංක ඉන්ධන ප්‍රමාණ සඳහන් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. ධාවන සටහන් අනුව වාහන භාවිතා කරන නිලධාරියා අත්සන් කර නොමැති අවස්ථාද විය. 2014 හා 2015 වර්ෂ වලදී පිළිවෙලින් ඉන්ධන සඳහා රු. 173,014 ක් හා රු. 291,306 ක් වශයෙන් වියදම් දරා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ වැඩ කරන දින 242 ක් වශයෙන් ගත් කල වර්ෂය තුලදී ඉන්ධන පැවති මිල අනුව කිලෝමීටර් 21464 ක් පමණ ධාවනය කර ඇත. ඒ අනුව වැඩකල දිනකට ධාවනය කල කිලෝමීටර් ගණන 89 ක් පමණ විය. ඉහත කරුණ අනුව උක්ත කැබ් රථය සඳහා දරණ ලද ඉන්ධන වියදම් පිළිබඳව විගණනයේදී මතබේදයට තුඩුදෙන කරුණක් විය.

3.3 වාහන උපයෝජනය

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) 2014 ජූනි 05 දින හෝ ඊට ආසන්න දිනකදී නිසි අවසරයකින් තොරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් අංක PB 6386 දරණ කැබ් රථය පදවාගෙන යන අවස්ථාවකදී හදිසි අනතුරකට ලක්වී රථයේ ඉදිරිපස දකුණු පැති පෙදෙසට බරපතල ලෙස අනතුරක් සිදුවී තිබුණි. උක්ත අනතුර සිදුවීමෙන් පසු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ද නොසලකා නාගරික කොමසාරිස්වරයාගේ අනුමැතිය මත රු. 396,756 ක් වැයකර ආයතන 04 කින් අමතර කොටස් මිලදී ගැනීම හා අළුත්වැඩියා කිරීම සඳහා නගර සභා අරමුදලින් වැය දරා තිබුණි. උක්ත වියදම් ආවරණය සඳහා රක්ෂණ සමාගම විසින් රු. 90,836 ක් ලබා දී ඇතත් ඉතිරි රු. 307,920 ක හානිය සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. රජයේ මුදල් රෙගුලාසි අංක 101 සි 110 දක්වා මුදල් රෙගුලාසි අනුව අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව අංක PB 6386 දරණ කැබ් රථය 2015 මැතිවරණ රාජකාරී සඳහා යොදවා තිබූ අතර, 2015 අගෝස්තු 18 දින රියදුරු මැතිවරණ රාජකාරී අවසන් කිරීමෙන් පසු වාහනයේ යතුර නාගරික කොමසාරිස්වරයාට භාරදී තම රාජකාරිය අවසන් කර ඇත. නමුත් පොලිස් වාර්තාවට අනුව 2015 අගෝස්තු 18 දින සවස 04 හෝ ඊට ආසන්න වේලාවකදී නාගරික කොමසාරිස්වරයා විසින් විශේෂ අනුමැතියකින් තොරව රථය ධාවනය කරමින් පැවතියදී ඇහැලියගොඩ බදුවත්ත ප්‍රදේශයේදී නින්ද යාමෙන් වාහනය මාර්ගයෙන් පිටතට පැන කැබ් රථයට බරපතල ලෙස හානි සිදු වී ඇති බව අනාවරණය විය. ඒ අනුව සිදුවූ අනතුරින් රු. 410,350 ක අලාභයක් සිදුවී තිබූ අතර, රක්ෂණ ආවරණය මඟින් රු. 291,000 ක මුදලක් ලැබී තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 101 සිට 110 දක්වා රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 මාර්තු මස 29 දින හෝ ඊට ආසන්න දිනයක සිට අංක LF 1102 දරණ ගිණි ලොරියේ පොම්පය මඟින් ඉන්ධන (පෙට්‍රල්) කාන්දුවක් සිදුවන බව හා ඉන්ධන අධික ලෙස අපතේ යන බව ලිඛිතව හා වාචිකව දිගින් දිගටම දැනුවත් කර තිබියදී මෙම රථය ගිණි නිවීමට අදාල නොවන රාජකාරීන්ට යොදවා තිබූ අතර, එහිදී එක් අවස්ථාවක 2014 මැයි 26 දින මහජන පොල සේදීම සඳහා යොදවා ගෙන තිබූ අවස්ථාවක අධික තෙල් කාන්දුව හේතුවෙන් පැයකට අඩු කාලයකදී පෙට්‍රල් අවසන් වී නැවත පෙට්‍රල් පුරවා ඇත. එහිදී දෙවතාවකදී පෙට්‍රල් ලීටර් 24 ක් ගැනීමට සිදු වූ බව රථයේ රියදුරු ධාවන සටහනේ ලිඛිතව අත්සන් යොදා සනාථ කර තිබුණි. එවැනි තත්ත්වයක් පැවතියදී උක්ත පොම්පය තවදුරටත් එවැනි කාර්යයන් සඳහා දිගින් දිගටම යෙදවීමෙන් 2015 ජූනි 04 දින හෝ ඊට ආසන්න දිනකදී රත්නපුර මහජන පොල සෝදා පවිත්‍ර කිරීමට යොදවා ගෙන ඇති අතර, පොම්පය ගිණි ගැනීමකට ලක්වී අක්‍රිය වී තිබුණි. ඒ අනුව විෂයය පථයෙන් බැහැරව නොසැලකිලිමත් අන්දමින් සේවයේ යෙදවීම හේතුවෙන් රු. 384,212 ක අලාභයක් සිදුව තිබූ අතර, හානිය සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි අංක 104(3) ප්‍රකාරවද කටයුතු කර නොතිබුණි.

(ඈ) ලියාපදිංචි අංක 251-2574 දරණ උක්ත කැබ් රථය 2015 ජූනි 25 දින හෝ ආසන්න දිනකදී නාගරික කොමසාරිස් විසින් අනවසරයෙන් පෞද්ගලිකව ධාවනය කරමින් පවතින අවස්ථාවක එංජිම අධික ලෙස රත්වී අක්‍රියවී තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව හෝ වෙනත් කිසිඳු පරීක්ෂාවකින් තොරව වාහන අංගනයේදී ගලවා අළුත්වැඩියාවක් සිදුකර තිබුණි. ඉන්ඩිගේටරයේ සම්බන්ධතාවය ගැලවී යාමෙන් සිදුවී ඇති මෙම තත්ත්වය රියදුරුට ක්ෂණිකව දැන ගැනීමට හැකි බවත්, එවන් අවස්ථාවක වහාම රථය නවතා ගැනීමේ හැකියාව පවතින නමුත් මෙලෙස එන්ජිම අධිකව රත්වී මෙතරම් හානියක් සිදුවීම නොසැලකිලිමත්ව කටයුතු කිරීමෙන් සිදුවූවක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

3.4 දෘශ්‍ය වංචනික ගනුදෙනු

--------------------------

සභා බල ප්‍රදේශය තුල පිහිටි යම් දේපලකට වරිපනම් අංක ලබා දීමේදී සහ වරිපනම් නාම ලේඛණ වල නම සංශෝධනය කිරීමේදී දේපලෙහි වාර්ෂික වටිනාකම මත හෝ ඔප්පුවේ වටිනාකම මත අය කරනු ලබන සියයට 01 ක්වූ නියමිත ගාස්තුව සඳහා පාරිභෝගිකයා හට නිකුත් කල ලදුපත් හා දෛනික වාර්තා (ෂෙඩුල්පත්) පිළියෙල කිරීමේදී එකතුව රු. 2,313,541 ක මුදලක් දූෂ්සන්ධානයෙන් යුතුව කටයුතු කිරීමෙන් සභා අරමුදලට බැර නොකර වංචා කර ව්‍යාජ ලදුපත් නිකුත් කිරිම, මුදල් ලදු පිටපත් වල මුල් පිටපත් අස්ථානගත කිරිම මගින් මෙම අක්‍රමිකතා සිදුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.5 ආර්ථික නොවන ගනුදෙනු

--------------------------------

කුඩුගල්වත්ත වෙළඳ සංකීර්ණයේ කඩකාමර අංක 06 හා 07 යන කඩකාමර ටෙන්ඩර් ලබාගත් බදුකරුවන් අවම ප්‍රදාන මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 05 දින රු. 41,328 ක් වැයකර ටෙන්ඩර් කැඳවා තිබුණි. නමුත් මෙම ටෙන්ඩර් කැඳවීමට ප්‍රථම අංක 06 හා 07 වෙළඳසැල් බදු ලබා ගැනීම සඳහා පිළිවෙලින් රු. 2,001,000 ක් හා රු. 2,002,250 ක් වූ බදු මුදලකට ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්කරුවන් දෙදෙනාටම එම ඉල්ලා තිබූ බදු මුදලට ටෙන්ඩර් ලබාදී තිබුණි. මේ අනුව ටෙන්ඩර් කිරීමට වැයකල මුදල නිෂ්කාර්යය වියදමක් විය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>කටුගස්ඇල්ල ජල මූලාශ්‍රයට ප්‍රවේශ වන මාර්ගය - I හා II අදියර.</u>

(i) උක්ත කර්මාන්තයේ I අදියර වෙනුවෙන් 2015 ජූනි මස 30 දින රු. 699,410 ක් හා 2015 ජූනි 11 දින රු. 1,635,249 ක් වශයෙන් අනුමත සමිතියක් සමඟ ගිවිසුම් 02 කට එළඹ තිබූ අතර, සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ii) 2015 සැප්තැම්බර් 14 දින සභාවේ කාර්මික නිලධාරී සමඟ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව මාර්ගයේ පස් කියුබ් කිහිපයක් ගෙනවිත් දැමීමෙන් ඔබ්බට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවූ අතර, ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වනවිට දෙවන අදියරේ ගිවිසුම්ගත කාලය අවසන් වී තිබූ අතර, පළමු අදියරේ ගිවිසුම්ගත කාලය අවසන් වීමට ආසන්නව තිබූ නමුත් ඉදිකිරීම් කටයුතු වල සතුටුදායක ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි.

(ආ) <u>ශ්‍රීපාද මාවත - එකමුතු අවමංගල්‍යාධාර සමිති ගොඩනැගිල්ල ඉදිකිරීම</u>.

(i) අදියර 04 ක් යටතේ විවිධ අවස්ථා වලදී මහා නගර සභාව විසින් සමෘද්ධි සමිතියක් සමඟ 2014 සැප්තැම්බර් , නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හි රු. 4,307,564 ක්වූ ගිවිසුම් 4 කට වලට එළඹ තිබුණි. පස්වන අදියර යටතේ තවදුරටත් රු. 1,506,529 ක ගිවිසුමකට එළඹීමට නියමිතව සිටි අතර උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක්ද සිදුකර නොතිබුණි. එසේම රුපියල් මිලියන 25 ට අඩු ඉදිකිරීම් අදියර වශයෙන් වෙන් නොකල යුතු බවට මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇමතු හා 2015 මාර්තු 27 දිනැති අංක FC/SABP/M/2/2015 දරණ ලිපිය මඟින් දන්වා තිබුණද ඒ පිළිබඳව නොසලකා කටයුතු කර තිබුණි.

(ii) 2015 ජූනි 18 දින හා 2015 සැප්තැම්බර් 14 දින වලදී කාර්මික නිලධාරී සමඟ සිදුකල ස්ථාන පරීක්ෂාවේදී අනුමත සැලැස්මට පටහැනි අයුරින් ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති බව නිරීක්ෂණය විය. තවද, 2016 මාර්තු මාසය වනවිට ගොඩනැගිල්ලේ බිම් මහලේ තට්ටුව නිම කර ඇති බවත්, ව්‍යාපෘතිය අවසන් වන නිශ්චිත කාල වකවානුවක් පිළිබඳව සහතික වීමක් නොමැති බවත් අනාවරණය විය.ව්‍යාපෘතිය දීර්ඝ කාලීනව ප්‍රමාද වන තත්ත්වයක් නිරීක්ෂණය විය.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 41 කට අදාලව රු. 2,950,000 මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක යොදා ගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 25 ක මූලික ප්‍රතිපාදනයෙන් කිසිඳු වියදමක් නොදැරීම හේතුවෙන් එකී වැය විෂයයන්ගෙන් සියයට 7 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරුකිරීම් 02 ක් සඳහා පිළිවෙලින් 2015 ඔක්තෝබර් 14 සහ 2015 දෙසැම්බර් 30 දිනයන්හීදී මුදල් කාරක සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණද, වැය විෂයයන් 25 කට අදාලව එකී දිනයන්ට පෙර ප්‍රතිපාදන ඉක්මවා රු. 18,128,219 ක වියදම් දරා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ අයවැය ලේඛණය අනුව ආදායම් වශයෙන් ඇස්තමේන්තුගත කරන ලද රු. 63,582,900 ක ආදායම් 2015 නොවැම්බර් 19 දිනැති සභා තීරණය අනුව කපා හැර තිබූ අතර, එම ආදායමට අදාලව වියදම්ද කපාහැර තිබුණි.

4.2 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

----------------------------------------------

අවම වශයෙන් ඉදිරි වර්ෂ 03 ක් සඳහා වන සංයුක්ත සැලැස්මක් සහ එම සැලැස්මට අනුකූල වන පරිදි ඉදිරියට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

-----------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි

4.6 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම වූ රු. 329,341,255 ක් වන විගණන විමසුම් 34 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

05. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය